# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2418/46 - 2025 ජනවාරි මස 11 වැනි සෙනසුරාදා - 2025.01.11**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**සබරගමුව පළාතේ පළාත් සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 171 හා 184 වන වගන්ති යටතේ වන රීති

ප්‍රාදේශීය සභාවල මූල්‍ය හා පරිපාලන කටයුතුවලට අදාළ බලතල කාර්යය කර්තව්‍ය නියම කිරීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික සියලු කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම අවශ්‍යව ඇති හෙයින් ද 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 171 සහ 184 වන වගන්ති සමග කියවිය යුතු 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික) විධිවිධාන පනතේ 2 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර සබරගමුව පළාතේ ආණ්ඩුකාරවර ඒ.ඒ.සී.ජේ.රාජරත්න වන මා විසින් ප්‍රාදේශීය සභාවල පරිපාලනය හා මූල්‍ය පාලනය විධිමත් කිරීම සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ප්‍රකාශයට පත් කර ඇති පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය - 2017 සබරගමුව පළාතේ සියලුම ප්‍රාදේශීය සභා සඳහා අදාළ කර ගත යුතු බව ප්‍රකාශයට පත්කරනු ලැබේ.

1989.04.17 දින සහ 554/5 අංක දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කර ඇති 1988 ප්‍රාදේශීය සභා ( මූල්‍ය හා පරිපාලන) රීතිවලින් ආවරණය නොවන පරිපාලනය හා මූල්‍ය පාලනය සඳහා වන ක්ෂේත්‍රයන් සඳහා මෙම ගිණුම් ප්‍රමිති 2025 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතුය.

**ඒ.ඒ.සී.ජේ. රාජරත්න,**
ආණ්ඩුකාරවර,
සබරගමුව පළාත.

2024 දෙසැම්බර් මස 31 වැනි දින,
සබරගමුව පළාත් සභාවේ දීය.

EOG 01 - 0104/1


1A - PG 6989 - 05 (2025/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## සබරගමුව පළාතේ පළාත් සභාව

### 255 වන අධිකාරය නගර සභා ආඥාපනතේ 193 හා 194 වන වගන්ති යටතේ වන රීති

නගර සභාවල මූල්‍ය හා පරිපාලන කටයුතුවලට අදාළ බලතල කාර්යය කර්තව්‍ය නියම කිරීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික සියලු කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම අවශ්‍යව ඇති හෙයින් ද 255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ 193 සහ 194 වන වගන්ති සමග කියවිය යුතු 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික) විධිවිධාන පනතේ 2 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර සබරගමුව පළාතේ ආණ්ඩුකාරවර ඒ.ඒ.සී.ජේ.රාජරත්න වන මා විසින් නගර සභාවල පරිපාලනය හා මූල්‍ය පාලනය විධිමත් කිරීම සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ප්‍රකාශයට පත් කර ඇති පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති - 2017 සබරගමුව පළාතේ සියලුම නගර සභා සඳහා 2025 ජනවාරි මස 01 වැනි දින සිට අදාළ කර ගත යුතු බව ප්‍රකාශයට පත්කරනු ලැබේ.

**ඒ.ඒ.සී.ජේ. රාජරත්න,**
ආණ්ඩුකාරවර,
සබරගමුව පළාත.

2024 දෙසැම්බර් මස 31 වැනි දින,
සබරගමුව පළාත් සභාවේ දීය.

EOG 01—0104/2

---

## සබරගමුව පළාතේ පළාත් සභාව

### 252 වන අධිකාරය මහා නගර සභා ආඥාපනතේ 289 වන වගන්තිය යටතේ වන රීති

මහා නගර සභාවල මූල්‍ය හා පරිපාලන කටයුතුවලට අදාළ බලතල කාර්යය කර්තව්‍ය නියම කිරීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික සියලු කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම අවශ්‍යව ඇති හෙයින් ද 252 අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 289 වගන්තිය සමග කියවිය යුතු 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික) විධිවිධාන පනතේ 2 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර සබරගමුව පළාතේ ආණ්ඩුකාරවර ඒ.ඒ.සී.ජේ.රාජරත්න වන මා විසින් මහා නගර සභාවල පරිපාලනය හා මූල්‍ය පාලනය විධිමත් කිරීම සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ප්‍රකාශයට පත් කර ඇති පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති - 2017 සබරගමුව පළාතේ සියලුම මහා නගර සභා සඳහා 2025 ජනවාරි මස 01 වැනි දින සිට අදාළ කර ගත යුතු බව ප්‍රකාශයට පත්කරනු ලැබේ.

**ඒ.ඒ.සී.ජේ. රාජරත්න,**
ආණ්ඩුකාරවර,
සබරගමුව පළාත.

2024 දෙසැම්බර් මස 31 වැනි දින,
සබරගමුව පළාත් සභාවේ දීය.

EOG 01 - 0104/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.